ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය - **2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියෝජිතායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය නියෝජිතායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජිතායතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියෝජිතායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජිතායතනය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජිතායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියෝජිතායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියෝජිතායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නියෝජිතායතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) උපදේශන සේවා ආදායමෙන් ඉකුත් වර්ෂයේ නියෝජිතායතනය මිලදී ගත් දේපල පිරියත හා උපකරණ වටිනාකම වූ රු. 3,374,470 ක් විදේශ ප්‍රදාන ලැබීම් ලෙස ගිණුම්ගත කිරීමේ වරද සමාලෝචිත වර්ෂයේ නිවැරදි කර තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 53 වන ඡේදය ප්‍රකාරව පූර්ව වර්ෂ වැරදි නිවැරදි කිරීම් වලට අදාල සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. තවද මූල්‍ය ප්‍රකාශන සටහන් වල දැක්වෙන ව්‍යාපෘති සහ වෙනත් ණයහිමියෝ, කෙරිගෙන යන වැඩ, ණයගැතියෝ යන වත්කම් සහ බැරකම් වලට අදාල පෙර වර්ෂ සංසන්දනාත්මක තොරතුරුද දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ. | පෙර වර්ෂ ගැලපීම් අතීතානුයෝගීව ගලපා ගිණුම් ප්‍රමිතය අනුව සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 48 වගන්තිය ප්‍රකාරව ආදායම් හා වියදම් හිලව් නොකල යුතු වුවද රු. 102,804 ක් වූ වියදම වෙනත් ආදායම් වලින් අඩුකර දක්වා තිබූ අතර ව්‍යාපෘති ණයහිමියන් තුල එකතුව රු.432,448 ක් වූ හර ශේෂයද එලෙස හිලව් කර තිබුණි. | මෙම වරද පිළිගන්නා අතර ගිණුම්කරණ පැකේජයේ මෙලෙස හඳුනාගැනීම නිසා මෙලෙස ගිණුම් තුල ගිණුම් ගත කර ඇත. මෙය ඉදිරියේදී ඇති නොවීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතිය ප්‍රකාරව ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකර වෙන් වෙන්ම මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු. 99,663, 068ක් වූ මෝටර් රථ තවදුරටත් භාවිතා කරමින් පැවතියද එම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. එසේම මෙකී වත්කම් වල ඵලදායී ජීවිත කාලය සම්බන්ධ වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව නැවත නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රත්‍යාගණන කටයුතු සිදු කර නොමැති බැවින් ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කල යුතු අතර ප්‍රමිතය ප්‍රකාරව එම වත්කම් වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ ඇස්තමේන්තු ගත දෝෂය නැවත නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 19 ඡේදය ප්‍රකාරව සපයන සේවාවේ නිමකල තත්වය අනුව සේවා ගණුදෙනුවේ අයභාරය හඳුනාගන්නා බව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ උපදේශන ආදායම් රු. 93,848, 483ක් ව්‍යාපෘති ණය හිමියන් යටතේ ගිණුම් ගත කර තිබූ අතර ඒ යටතේ දරණ වියදම් ව්‍යාපෘති ණය හිමියන්ගෙන් අඩුකර දක්වා තිබුණි. එසේ වුවත් ව්‍යාපෘති නිම කළ මට්ටම අනුව හඳුනාගත යුතු ආදායම ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | ආයතනයේ උපදේශන ව්‍යාපෘති ක්‍රමවේදය වනුයේ ව්‍යාපෘති භාර ගත් පසු ඒ වගකීමක් ලෙස හඳුනා ගැනීමත් හා අදාල වැඩ නිම කිරීමෙන් පසු පමණක් ආදායමක් ලෙස පරිවර්තනය කර ගන්නා ක්‍රමයකි. | ප්‍රමිතය ප්‍රකාරව සේවා කොන්ත්‍රාත් වල නිමකල අදියර අනුව සේවා ආදායම හඳුනා ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය ප්‍රකාරව වාහන සියයට 20 බැගින් ක්ෂය කල යුතු වුවත් 2016 මාර්තු 15 දින මිලට ගෙන තිබුණු පිරිවැය රු. 33,535,000 ක් වූ මෝටර් රථ 05 කට අදාල රු. 6,707,000 ක් වූ ක්ෂය වෙන් කිරීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගලපා නොතිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයේ අඩුවෙන් දැක්වුණි. එසේම සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ වටිනාකමද රු. 1,676,750 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය ප්‍රකාරව වාහන ක්ෂය කල යුතු අතර සියළුම වත්කම් ද ගිණුම් ගත කල යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) නියෝජිතායතනය විසින් භාවිතා කරනු ලබන පනාපිටිය හා කප්පරතොට පිහිටි පිළිවෙලින් හෙක්ටයාර් 3.416 ක් සහ හෙක්ටයාර් 1.025 ක් වූ ඉඩම් 02 හි අයිතිය ආයතනයට පවරා ගැනීමට එම ඉඩම් වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම රකව හා කල්පිටිය යන ප්‍රදේශවල පිහිටි ඉඩම් වල වටිනාකම රු.268,750,000 ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ එම ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කල්පිටිය හා පනාපිටිය ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන වල ඉඩම් ද දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීමට ප්‍රාදේශීය ලේකම් එකඟතාවය ලබා දීම මත මේ වන විට ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇත.<br>කප්පරතොට ඉඩමෙන් කොටසක් පවරා ගැනීමේ කටයුතු අවසන් කර ඇති අතර එම කොටස ධීවර අමාත්‍යාංශයට නිදහස් කර ඇති බැවින් දීමනා පත්‍රයක් මඟින් අප වෙත පවරා දී ඇත. එහි ඉතිරි කොටස පවරා ගැනීම සඳහා අවශ්‍ය වන වන්දි මුදල් ද අප විසින් ගෙවා ඇති අතර, එම ක්‍රියාවලියේද බොහෝ කටයුතු අවසන් කර ඇත.<br><br>රකව ඉඩමද දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීමට ප්‍රාදේශීය ලේකම් එකඟතාවය පළ කර ඇත. | ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර එම ඉඩම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ආ) 2014 වර්ෂයේදී ප්‍රදාන ලෙස ලැබී ගිණුම්ගත කර නොතිබුණු වටිනාකම රු.9,390, 000 ක් වූ මෝටර් රථය සඳහා පෙර වර්ෂයට ගැලපීමක්ලෙස භාණ්ඩාගාර ප්‍රදාන ගිණුමට ගලපා තිබුණු නමුත් ක්‍රමක්ෂය එම රථයේ වටිනාකම භාණ්ඩාගාර ප්‍රදාන ගිණුමට නැවත ගලපා නොතිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි. | මෙය පිළිගන්නා අතර 2021 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදි නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | ප්‍රදාන ලෙස ලැබූ වත්කම් වලට අදාල ක්‍රමක්ෂය එම ප්‍රදාන ගිණුමට නැවත ගැලපිය යුතුය. |
| (ඇ) මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ රු. 2,500,157 ක් වූ මුදල් ප්‍රවාහයට බලපෑමක් නොමැති පෙර වර්ෂ ගැලපුම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා තිබුණු අතර 2020 වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් ආයෝජනය කර තිබුණු මුදල රු.2,230,389 ක් අඩුවෙන් මුදල් | ඉදිරියේදි මෙවැනි වැරදි සිදු නොවීමට වග බලා ගනු ලැබේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියල කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රවාහ ප්‍රකාශය තුල දක්වා තිබුණි. එසේම ගොඩනැගිලි ඉදිකිරීම් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණු රු.6,351,443 ක් කාරක ප්‍රාග්ධන වෙනස් වීම් යටතේ හා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දෙවරක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා තිබුණි. | මෙය නිසි පරිදි ගිණුම් ගත කර ඇත. | |
| (ඇ) | ස්ථාවර වත්කම් වාර්ෂික ක්ෂය වටිනාකම රු. 110,908,171 ක් ලෙස ගිණුම් ගත කර ඇති නමුත් වත්කම් වර්ගය සඳහා ක්ෂය ගණනය කිරීම් විස්තර විගණනය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු ක්ෂය වියදමෙහි නිවැරදිතාවය විගණනයේදී සනාථකර ගත නොහැකි විය. එසේම මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණු රු.8,928,589 ක් වූ කෙරීගෙන යන වැඩ අයිතමයන් 03 කට අදාල උපයෝගී ලියවිලි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම ශේෂවල නිවැරදිතාවය සතුටුදායක ලෙස විගණනයේදී සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | විගණකවරුන් ඉල්ලා සිටි ආකෘතියට අනුව ක්ෂය ගණනය කිරීමේ ආකෘතියක් ලබා දීමට නොහැකි වූ බව පිළිගන්නා අතර එයට ප්‍රධාන හේතුව වූයේ ප්‍රමාණවත් කාලයක් විගණකවරුන් ලබා නොදීමයි.<br><br>කෙරී ගෙන යන වැඩ<br><br>බෝට්ටුවක් සකස් කිරිම රු.2,902,938මෙම ලිපිගොනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව වෙත ලබා දී ඇත.<br>කල්පිටිය RRC සීමා බැමි ඉදිකිරිම රු.2,124,979 හා විද්‍යාගාර සංකීර්ණයක් ඉදි කිරීම රු.3,900,672අදාල ලිපි ගොනු විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. | විගණකවරුන් ඉල්ලා සිටි තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු වත්කම් අයිතම 09 ක අගය හා ඊට අනුරූපීව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අගයන් අතර රු.16,263,138 ක වෙනසක් නිරීක්ෂණය වූවද එකී වෙනස්කම් පිළිබඳ විගණනයට පැහැදිලි නොකෙරුණි | ගොඩනැගිලි ශේෂය රු.768,985 - 2017 වර්ෂයේදි ආරම්භක ශේෂය සටහන් කර ගැනීමේදි රු.595,000 වැඩියෙන් සටහන් කර ඇත. 2016 වර්ෂයේ ගලපන ලද රු.173,985 මුදල සොයා ගත යුතුව ඇත.<br><br>• 2016 වර්ෂයේදි හඳුනා ගන්නා ලද රු.1,720,300 ක ගැලපීම් කර වත්කම් රෙජිස්ටරය යාවත්කාලීන කරන ලද අතර තව දුරටත් රු.119,545.49 ක මුදලක් ගැලපුම් කිරිමට කරුණු සොයමින් පවති.<br><br>• මත්ස්‍ය ටැංකි යටතේ රු.2,153,399 බෝට්ටු සහ යාත්‍රා යටතේ රු.433,080 පරිගණක මෘදුකාංග යටතේ රු.2,206,499 යන අයිතමයන් වත්කම් ලේඛණයේ | වෙනස්කම් පිළිබඳ සොයා බලා නිවැරදි කල යුතුය. |

| | | |
|---|---|---|
| | නිවැරදි කිරීම් කර ඇත | |
| (ඊ) ආයතනයේ උපදේශන සේවා ශුද්ධලැබීම් ආදායමෙන් සියයට 5ක් ලෙස වෛද්‍ය සැළසුම් ආදායම් (Own Income Medical Scheme) අරමුදල් ගිණුමට බැරකර තිබුණු රු.2,630,159 ක මුදල අරමුදලක් ලෙසට මූල්‍ය ප්‍රකාශන වල දක්වනු වෙනුවට වෙනත් ණයහිමියන් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | ණය හිමියන් නමින් සඳහන් වුවද වෛද්‍ය අරමුදල නමින් බැර කිරීමක් ලෙස ඉදිරියේදි සඳහන් කිරීමට කටයුතු කරනු ලැබේ. | අරමුදල් ගිණුම්, අරමුදල් ලෙස මූල්‍ය ප්‍රකාශන වල ගැලපිය යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

### 1.6.1 ගෙවිය යුතු මුදල්

-----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------------------ | -------------- |
| මහා භාණ්ඩාගාරයට පියවිය යුතු රු.39,930,000 ක ව්‍යවස්ථාපිත ගෙවීමක් වසර 2 ක කාලයක් ඉක්මවා ගියද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂ වල ප්‍රමාණවත් ඉපයීම් නොතිබීම මත මෙම නිරවුල් කිරීම ප්‍රමාද වී ඇත. | ව්‍යවස්ථාපිත ගෙවීමක් බැවින් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුයි. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

--------------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ------------------------- | --------------------- | ---------------- | ------------- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i.) මු.රෙ.384 (3) | ලැබෙන සෑම චෙක්පොතක්ම පිළිබඳව විධිමත් ලේඛණයක සටහන් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. | මෙකී රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) මු.රෙ. 395 | පෙර මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශය ඊළඟ මාසයේ 15 දිනට හෝ ඊට පෙර පිළියෙල කර ඒ හා සම්බන්ධ ගෙවන නිළධාරියා විසින් සහතික කොට විගණකාධිපති වෙත පරීක්ෂා කිරීම සඳහා යොමු කල යුතු වුවත් ආයතනය එලෙස කටයුතු කර | බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි නිසි පරිදි සැකසීමට කටයුතු කර ඇත. 2022 වර්ෂයේ සිට ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. | බැංකු සැසඳුම් ප්‍රකාශ, රෙගුලාසිය ප්‍රකාරව කාලීනව සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. | | |
| **(iii) මු.රෙ. 570 සහ 571** | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පැවති රු.1,312,000 ක් වූ වගකීම් කාලය ඉකුත් වූ ටෙන්ඩර් තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ සඳහා ඇමුණුමක් ඉදිරිපත් කර ඇත. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) අංක 2016/30 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| (i.) 3.1 වගන්තිය | රාජ්‍ය ආයතන වල පවතින වාහන සඳහා ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කළ යුතු වුවත් නියෝජිතායතනය සතු වාහන 25 ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | නිළධාරින් රාජකාරි සඳහා කඩින් කඩ වාර්තා කිරිම නිසා ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි විය. | චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාවන් කිරීමට පියවර ගත යුතුය. |
| (ii.) 3.3 වගන්තිය | වාහන ලියාපදිංචි අංකය, දැවෙන ලීටර් ප්‍රමාණය, ධාවනය කල දුර, ලීටරයකින් ධාවනය කල දුර, අළුත් වැඩියා ගාස්තු ඇතුලත් වාහන ලොග් සටහන් පවත්වා නොතිබුණි. | එකඟ නොවේ. වාහන වල සියළු වියදම්, ධාවනය කල දුර, ලීටරයකින් ධාවනය කල දුර ආදි දත්ත යොදා ගෙන කාර්තුමය වශයෙන් වාර්තාවක් අභ්‍යන්තර විගණනය සඳහා යොමු කරන අතර අදාල දත්ත පරිගණක ගත කොට ඇති අතර ඒවා අනුව වාර්තා සකස් කොට ඇත.<br><br>දැනට නාරා ආයතනයේ සියළුම රථ වාහන (යතුරු පැදි හැර) සේවා හා අළුත්වැඩියා කටයුතු සිදු | චක්‍රලේඛය ප්‍රකාරව වාහන සඳහා ලොග් සටහන් පොත් නඩත්තු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කරනුයේ වාහන වල ඒජන්තවරුන් මගින් වේ. | |
| (iii.) 4.3 වගන්තිය | වාහන අළුත්වැඩියා කිරීමේදී වාහනයෙන් ගලවනු ලබන අමතර කොටස් අදාළ බිල්පත්‍රයක් සමඟ ආයතනයේ ගබඩාවට ලබාදිය යුතු වුවත් එලෙස බිල්පත්‍රය සමඟ අමතර කොටස් ගබඩාවට භාරදී නොතිබුණි. | | චක්‍රලේඛය ප්‍රකාරව ඉවත් කරනු ලබන අමතර කොටස් ආයතනයට ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් හා සංවර්ධන නියෝජිතායතන පනතේ 34 වගන්තිය | නියෝජිතායතනය විසින් සිදුකරනු ලබන අධ්‍යයන පර්යේෂණ,අත්හදා බැලීම් හා වෙනත් විමර්ශන සහ ගවේෂණ හා සොයා ගැනීම් වලට අදාළව ලබා ගන්නා ලද දත්ත,වාර්තා සහ විස්තර අඩංගු ලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මධ්‍ය පරිගණක දත්ත පදනමක් මේ සඳහා සකසා ඇත. දත්ත හුවමාරුව සඳහා ප්‍රතිපත්තියක්ද සකසා ඇත. පර්යේෂණ වාර්තා මෙහි අඩංගු කර ඇත. | පරිගණකගත දත්ත වලට අමතරව පනත ප්‍රකාරව පරිගණක දත්ත වල ගොනුව දක්වා සාරාංශ ගත ලේඛනයක් හෝ පවත්වා ගත යුතුය. |
| (ඈ)1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත සහ 1996 අංක 32 දරණ සංශෝධිත පනතෙහි 18 වන වගන්තිය | විද්‍යාත්මක හෝ තාක්ෂණික කමිටුවක් පත් කළ යුතු වුවත්, දැනට අක්‍රියව පවතින විද්‍යාත්මක හා තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා නව සාමාජිකයින් පත් කර නොතිබුණි. | මෙම කමිටු 2020 වසරේදී පත් කර ඇති අතර ව්‍යාපෘති ඇගයීම් කමිටු මෙම කමිටුව හරහා සිදු කර ඇත. | පනත ප්‍රකාරව කමිටු සඳහා සාමාජිකයන් පත් කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,852,531 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 16,444,930 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,592,399 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට නඩත්තු වියදම් මිලියන 37 කින්ද, පර්යේෂණ හා සංවර්ධන වියදම් මිලියන 35 කින්ද වෙනත් මෙහෙයුම් වියදම් රුපියල් මිලියන 87 කින්ද අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ව්‍යාපෘති ණය හිමි ශේෂ ලැයිස්තුවේ ඇතුලත්ව තිබුණු රු.20,420,827 ක් වටිනා ව්‍යාපෘති 27ක් වර්ෂ 7- 4ත් කාලයක සිට අක්‍රීයව පවතින නමුත් එම ව්‍යාපෘති පිළිබඳ සොයා බලා අදාල වගකීම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ව්‍යාපෘති උපලේඛනය හා ටෙන්ඩර් තැන්පතු ලේඛණය අනුව වටිනාකම රු.70,554,695 ක් වූ ව්‍යාපෘති 54ක් සඳහා ව්‍යාපෘති වාර්තා අදාල සේවාදායකයා වෙත නියමිත පරිදි ඉදිරිපත් කර ඇති බව විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | අංක 01 ව්‍යාපෘතිය අවසන් වී ඇති අතර උපකරණ මිළදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවති. ශේෂ ලැයිස්තුවේ අංක 08 සහ 09 යන ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක වන ව්‍යාපෘති වන අතර එම ලේඛණයෙන් ඉවත්විය යුතුය. අංක 12 ව්‍යාපෘතියේ මුදල් අමාත්‍යාංශය වෙත නැවත ගෙවා ඇත. අංක 14 සිට 26 දක්වා වූ ව්‍යාපෘති ක්‍රියාකාරි නොවන ව්‍යාපෘති ලෙස හඳුනාගෙන කපා හැරීමේ අනුමැතිය සඳහා පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කළද සාකච්ජා නොවීම හේතුවෙන් නැවත ඉදිරිපත් කිරීමට තබා ඇත. | අක්රියව පවතින ව්‍යාපෘති පිළිබඳ සොයා බලා අදාල වගකීම් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) වරායන් 06ක් සංවර්ධනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් පිළියෙල කිරීම වෙනුවෙන් බාහිර ආයතනයකට රු.1,612,898 ක් වැඩිපුර ගෙවා තිබුණද එය වර්ෂ 07කට වැඩි කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වැඩිපුර ගෙවීමට වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන එම නිළධාරින් සම්බන්ධව නීතිමය පියවර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | මෙම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ මණ්ඩලය මඟින් මුදල කපා ගැනීමට තීරණය කරන ලදි. එමෙන්ම මේ සම්බන්ධයෙන් තව දුරටත් අමාත්‍යාංශ විගණන හා කළමණාකරණ රැස්වීමේදි තවදුරටත් සාකච්ජා පවති. | වගකිව යුතු නිළධාරින් හඳුනාගෙන එම නිළධාරින් සම්බන්ධව නීතිමය පියවර ගැනීම කටයුතු කල යුතුය. |
| (ඇ) නිළධාරීන් ඉතිරි කරගත් වෛද්‍ය නිවාඩු සඳහා රු.8,338,757 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ස්වයං උත්පාදන ආදායමින් ගෙවා තිබු අතර දීමනා ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන තිබුණද භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මෙය දිර්ඝ කාලයක සිට සේවක අභිවෘධිය උදෙසා ස්වයං ඉපයීම් පදනම් කරගෙන කරන ලද ගෙවීමකි. | දීමනා ගෙවීම සඳහා විධිමත්ව අනුමැතිය ලබාගත යුතුයි. |

| | | |
|---|---|---|
| (ඇ) රු.40,269,931 ක් වූ සමාලෝචිත වර්ෂයේ මිලදීගත් වත්කම් එකතුකිරීම් වලට අදාල දේශීය හා විදේශීය ප්‍රදාන වෙන වෙනම ඉදිරිපත් නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය ගණනය කිරීම් නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. | නිවැරදිව තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුයි. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

---------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වෙරළබඩ ජලයේ මත්ස්‍ය නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා මාළු ඒකරාශී කිරීමේ ඇටවුම්(FADs) හා මත්ස්‍ය සම්පත වැඩිදියුණු කිරීමේ ඇටවුම් (FEDs) ස්ථාපනය කිරීමේ කටයුතු 2020 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම නවතා දැමීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා වැයකර තිබුණු රු.මිලියන 3.90 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | 2018 වසරේදී FAD 50ක් සින්නපාඩුව සහ වැලිගම ප්‍රදේශවල ස්ථානගත කර එහි පසුවිපරම් Trial fishing අවස්ථා 3කදී සිදු කර අවශ්‍ය දත්ත හා නිර්දේශ ලබා දී ඇත. එසේම 2019 වසරේදීද සාගරය තුල ගිල්වා තැබිය හැකි FADs වැලිගම, රුමස්සල, පොල්හේන හා උණවටුන ප්‍රදේශවල ස්ථානගත කර ඇත.COVID 19 වසංගත තත්වය සහ ව්‍යාපෘතියෙහි පසු විපරම් කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් හිඟයක් පැවතීම හේතුවෙන් භෞතික ප්‍රගතිය අපේක්ෂිත මට්ටමේ නොමැති නමුත් 2018 සහ 2019 වර්ෂ වලදී අවශ්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වී ඇති එබැවින් එම පර්යේෂණ ප්‍රතිඵල උපයෝගී කොට මත්ස්‍ය ගහණය වැඩිකිරීම සඳහා ප්‍රායෝගික පියවර අමාත්‍යාංශය විසින් ගෙන ඇත. එබැවින් එම වැය කල මුදල් නිෂ්කාර්ය වියදමක් ලෙස සැලකිය නොහැකියි. | ව්‍යාපෘතිය සඳහා වැයකල මුදල් නිෂ්කාර්ය වියදමක් නොවන ලෙස විකල්ප ක්‍රියා සලකා බලා ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) නියෝජිතායතනයේ අරමුණු වලට පටහැනිව රු.15,245,000 ක් වැයකර 2014 වර්ෂයේදී මත්ස්‍ය අලෙවි සැලක් බේරුවල පිහිටි නියෝජිතායතනය වෙත විධිමත් පරිදි පවරා නොගත් ඉඩමක, ඉදිකර තිබූ අතර එම අලෙවිසැල 2021 වර්ෂය අවසානය දක්වාම නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රදේශයේ මත්ස්‍ය ව්‍යාපාරිකයින් මෙම අලෙවි සැල තුල ව්‍යාපාර පවත්වා ගෙන යාමට අකමැති වීම නිසා නිශ්කාර්යව පවති. | අරමුණු වලට අනුව කටයුතු කල යුතු අතර වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) බෝට්ටු 02ක් නිෂ්පාදනය කිරීම සඳහා 2011 වර්ෂයේදී රු.4,493,052ක් වැයකර අධි බලැති බෝට්ටු එන්ජින් දෙකක් මිලට ගෙන බෝට්ටු 02 නිෂ්පාදනය කිරීමේ කටයුතු ආරම්භ කර ඒ වෙනුවෙන් අතිරේක රු.2,902,938 ක්ද දරා තිබුණි. එසේ වුවත් එම එන්ජින් දෙක හා නිෂ්පාදනය අවසන් නොකල බෝට්ටු 02ක 2021 වර්ෂය අවසානය දක්වාම ගබඩාවේ නිෂ්කාර්යව තබා තිබුණි. | අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ජා වට කිහිපයකින් පසුව තිරණය වු පරිදි වෙනත් රාජ්‍ය ආයතනයක් වෙත පැවරීමට ඉදිරි කටයුතු ක්‍රියාත්මක වෙමින් පවති. | ව්‍යාපෘතිය සඳහා වැයකල මුදල් නිෂ්කාර්ය වියදමක් නොවන ලෙස කටයුතු කල යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යක්ෂ මුදල් තනතුරු සඳහා අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය අනුව මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණු නිළධාරියෙකු අධ්‍යක්ෂක මූල්‍ය තනතුර සඳහා බඳවා ගෙන 2017 මැයි සිට 2020දෙසැම්බර් 31 දක්වා වැටුප් හා දීමනා ලෙස එකතුව රු.7,666,842 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පෙර වර්ෂ 02 කදී පෙන්වා තිබුණද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් තෝරගෙන, පාලක මණ්ඩලයේ අනුමැතිය මත අධ්‍යක්ෂ මූල්‍ය තනතුරට බඳවාගෙන ඇති අතර, මොහුගේ සුදුසුකම් වල වෙනස සම්බන්ධයෙන් නාරා පාලක මණ්ඩලය විසින් සුදුසුකම් සපුරා ගැනීම සඳහා පරිවාස කාලය දීර්ඝ කර ඇත. ඒ මහතා ඒ සම්බන්ධයෙන් අදාල කටයුතු සිදුකරමින් පවතී. විගණනය මගින් පෙන්වා දී ඇති උපදෙස් ප්‍රකාරව කටයුතු කළහොත් ආයතනයට නීතිමය ගැටළුවකට මුහුණදීමට සිදුවන බව නිරීක්ෂණය කරමි. තවද, මෙම බඳවාගැනීම සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ විමර්ෂණ ඒකකය මගින් ද විමර්ෂණයක් සිදු කරමින් පවතින අතර, ඒ ලැබෙන පිළිතුර හා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ජේදයේ 11.9 උප වගන්තිය අනුව ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමට අදාල කටයුතු කරනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි. | බඳවාගැනීමේ පටිපාටිය අනුව නියමිත බඳවා ගැනීම් කළ යුතුය. |